# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/221 /2023 (PSC)**

01. කේ.එස්.එම්.ද සිල්වා,
02. කේ.ටී.පී.යූ. කාරියවසම්,
03. කේ.ඩී.අයි.එස්.කේ.සිරිවර්ධන
04. ඩී.පී.එන්.කුමාරි,
05. ඩබ්.කේ.ඩී.ඩන්ස්ටන්,
06. කේ.එම්.බී.පී.වීරසිංහ

**අභියාචකවරුන්**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

**වගඋත්තරකරු**

**දිනය :-2026.05.14**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචකවරු 06 දෙනා පුද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.ඒ.එස්.එම්.රූපසිංහ මිය.

## -<u>**නියෝගය**</u>-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචකවරුන් 06 දෙනා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තියේ නිලධාරීන් ලෙස මුදල් අමාත්‍යාංශයේ විවිධ දෙපාර්තමේන්තු වල සේවය කරනු ලබයි. මෙම අභියාචකරු 2008.12.15 දින ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III පන්තියේ නිලධාරීන් ලෙස රාජ්‍ය සේවයට එක්වී ඇති අතර, 2020.12.15 දින පළමු ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත. 2022 වසරේ මාර්තු මාසයේ අදාළ පත්වීම් ලිපි රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් 2020.12.15 දින සිට බලපැවැත්වෙන පරිදි ලබා දී ඇත. ඉන් පසුව මුදල් අමාත්‍යාංශය යටතේ විවිධ දෙපාර්තමේන්තු වල පැවති පළමු පන්තියේ තනතුරු සඳහා අධ්‍යක්ෂ තනතුරු වලට මෙම නිලධාරීන්ම, මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්/ අදාළ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර ඇත. ඉන්පසු එම තනතුරු වලට ස්ථිර වැඩබලන පත්වීමක් ලබා ගැනීම ඉල්ලීම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වෙත ඉදිරිපත් කර ඇත. මෙම ඉල්ලීම් සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය එකඟතාවයක් දක්වා නැති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ද අදාළ පත්වීම් සඳහා අනුමැතිය ලබා දී නැත. ඉන් පසුවද සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර ඇති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඇත. ඉන් තෘප්තිමත් නොවූ අභියාචකවරු 2023.12.13 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අදාළ අභියාචකයින් අභියාචනයෙන් දක්වා සිටින්නේ,

> "04. *කෙසේ වුවද පත්වීම් විධිමත් අධිකාරී බලයක් නොමැතිව සිදුකර ඇති බව දක්වා ඉහත නම් සඳහන් අප හට විධිමත් පත්වීම් ලබාදීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කර ඇති බව මුදල් අමාත්‍යාංශයේ ලේකම් ලිපි අංක MF1/01/03/AD/SLACS හා 2023.12.08 දිනැති ලිපිය මගින් දන්වා ඇත.,*
>
> *06. එසේම තනතුරට අදාල කිසිදු මූල්‍යමය වරප්‍රසාදයක් නොලබා තනතුරට අදාළ වන සියළු වගකීම් දරමින් අවුරුදු 1 1/2 වැඩි කාලයක් අප සියළුදෙනා රාජකාරි කටයුතු කරමින් සිටින අතර, ඉහත කරුණු සළකා බලා අප හට අදාළ තනතුරට අනුයුක්ත කළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි විධිමත් පත්වීම් ලබාදීමට ඇති අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු."*

අදාළ ඉල්ලීමට අමතරව අභියාචකවරු විසින්,

(1) 2024.05.15 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ වලට ප්‍රතිනිරීක්ෂණ,

(2) 2025.05.01 දින හිඟ දීමනා සමඟ සහන ලබා දෙන මෙන් ඉල්ලීම,

(3) 2026.02.23 ඇමුණුම් රාශියක් සමඟ නව ඉදිරිපත් කිරීම් සිදුකර ඇත. එයට අමතරව විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම්ද සිදුකරන ලදි.

මෙම කරුණ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ද තම නිරීක්ෂණ මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත.

(1) 2024.03.22 - පැහැදිලි වාර්තාවක් සමඟ අදාළ ඇමුණුම්,

(2) 2024.10.21 - වැඩිදුර නිරීක්ෂණ,

(3) 2025.07.25 - නිරීක්ෂණ

(4) 2025.09.16 - නිරීක්ෂණ

මෙයට අමතරව විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම්ද සිදුකරන ලදි. මෙම සියළු කරුණු කෙරේ අධිකාරයේ අවධානය යොමු කරන ලදි. මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.03.02 ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ

වෙත අවධානය යොමු කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරේ විශේෂ අවධානය යොමු කරන ලදි.

(7) එවකට සැළකිය යුතු මට්ටමේ I ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පැවතීම් හා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පුරප්පාඩු සම්පූර්ණ කිරීමට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් තාවකාලිකව ජ්‍යෙෂ්ඨතාවය මත පදනම්ව I ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීම සඳහා PSC/APP/06/952/2020 හා 2021.04.28 දිනැති නියෝගය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.(ඇමුණුම් II)

(8) ඒ අනුව නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය ප්‍රකාරව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීම සිදුකරන ලදි.

(9) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට 2008 වර්ෂයේ අප්‍රේල් හා දෙසැම්බර් මස කණ්ඩායම් දෙකක් බඳවා ගැනුණු අතර එම නිලධාරීන් පිළිවෙලින් 2020 අප්‍රේල් හා දෙසැම්බර් මාසයන් හිදි ඔවුන් විසින් අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීම මත පදනම් ව I ශ්‍රේණියට උසස් කරන ලද අතර උසස් වීමෙන් අනතුරුව තනතුරු වලට පත් කරන ලද්දේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය පදනම් කරගෙන ය.

10. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 33/2019 චක්‍රලේඛය අනුව සේවා ව්‍යවස්ථාවේ 5 පරිශිෂ්ඨයේ සුදුසුකම් සම්පූර්ණ කිරීමට අදාළ සහන කාලයක් මෙම නිලධාරීන්ට හිමි බැවින් නිලධාරීන් කිසිවෙකුට අගතියක් නොවීම පිණිස මෙලෙස තනතුරු ලබාදීමට කටයුතු කර ඇත.

11. ඒ අනුව මෙම කණ්ඩායම් දෙක අතුරින් I ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීමේ දී, 2008 වර්ෂයේ අප්‍රේල් මස බඳවා ගන්නා ලද කණ්ඩායම පළමුවෙන් තනතුරු සඳහා ස්ථානගත කිරීමට කටයුතු කරන ලදි.

12. මෙහිදී පරිපාලන බලධරයා වශයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිලධාරීන් I ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීම සිදුකරන ලද අතර, අනතුරුව විධිමත් අනුමැතිය හා පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සිදුකරනු ලබයි.

13. ඒ අනුව, විධිමත් ක්‍රියා පටිපාටියක් යටතේ නිලධාරීන් I ශ්‍රේණියේ තනතුරු සඳහා ස්ථානගත කිරීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් සිදු කරමින් පැවති අවස්ථාවක දී එයට පරබාහිරව 2008 දෙසැම්බර් මස කණ්ඩායමේ නිලධාරීන් හත් (07) දෙනෙකු මුදල් අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු වල ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා ස්ථානගත කිරීමට මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කටයුතු කර ඇත.

| | නම | තනතුර | තනතුරට පත්කළ දිනය |
|---|---|---|---|
| 1 | කේ.එස්.එම්.ද සිල්වා මයා | අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව (පූර්ණ කාලීන වැ.බැ. | 2021.01.11 (වැ.බැ) |
| 2 | කේ.පී.යූ.පී.කාරියවසම් මය | අධ්‍යක්ෂ (දේශිය ණය) භාණ්ඩාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 2022.06.02 |
| 3 | කේ.ඩී.අයි.එස්.කේ.සිරිවර්ධන මිය | අධ්‍යක්ෂ, (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ) භාණ්ඩාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 2022.03.23 |
| 4 | ඩී.පී.එන්.කුමාරි මිය | අධ්‍යක්ෂ සංවර්ධන මුල්‍ය දෙපාර්තමේන්තුව | 2022.05.25 |
| 5 | ඩබ්.කේ.ඩී.ඩන්ස්ටන් මිය | අධ්‍යක්ෂ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව (පූර්ණ කාලීන වැ.බැ) | 2022.05.05 |
| 6 | කේ.එම්.බී.පී.වීරසිංහ මෙය | ප්‍රධාන ගණකාධිකාරී, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 2022.07.20 |
| 7 | ඩී.යූ.රත්නවීර මහත්මිය | අධ්‍යක්ෂ (දේශීය/විදේශීය ප්‍රධාන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 2022.06.02 |

14. එම නිලධාරීන් හත් දෙනා වෙත විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් මගින් අදාළ ලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති නමුත්, පැවති ක්‍රමවේදයට පරිබාහිරව යමින් සිදුකරන ලද පත්කිරීම් බැවින්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් එම පත්කිරීම් නිර්දේශ කිරීම ප්‍රතික්ෂේප කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම් 11)

15. එහිදී පහත හේතුන් මත පදනම් ව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උක්ත පත් කිරීම් ප්‍රතික්ෂේප කර ඇත.

    i. 2022 නොවැම්බර් මස වන විට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සංඛ්‍යාව 614ක් වන අතර 1 ශ්‍රේණියේ අතිරික්ත කාර්ය මණ්ඩලය 112 ක් වන බව,

    ii. එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශ 2022.05.09 දිනැතිව අහෝසි වීම හා ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/00/1/4/12 හා 2022.09.12 දිනැති ලිපිය මගින් එකී රාජ්‍ය අමාත්‍යාංශ සඳහා වෙනම වැය ශීර්ෂයක් වෙන් නොකරන බවට දැනුම් දී තිබීම හේතුවෙන් එම රාජ්‍ය අමාත්‍යාංශවල සේවයේ නිරතව සිටි ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I ශ්‍රේණියේ නිලධාරීන් පනස් දෙනෙකු ස්ථානගත කිරීම ගැටලු සහගත වීම.

iii. පසුගිය කාල වකවානුව මුළුල්ලේම ජ්‍යෙෂ්ඨත්වය මත පමණක් පදනම්ව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීමට කටයුතු කර තිබීම.

iv. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීම සඳහා එයට ඉල්ලුම් කරන ලද නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සළකා තනතුරු වලට පත් කිරීම සිදුකර ඇති අතර, **2020.04.21** දිනට උසස් වු නිලධාරීන් **156** ක් අතුරින් **89** දෙනෙකු පමණක් එක ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කර ඇති බව.

v. තවදුරටත් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු නොමැති වීම මත **2020.04.21** දිනට I ශ්‍රේණියට උසස් වූ නිලධාරීන් අතුරින් කොළඹ දිස්ත්‍රික්කය තුළ තනතුරු ඉල්ලුම් කරන ලද නිලධාරීන්ට හෝ තනතුරු ලබා දීමට නොහැකි වී ඇති බව.

**16.** ඒ අනුව උක්ත කරුණු මත පදනම් ව **2020.12.15** දිනට I ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් මුදල් අමාත්‍යාංශය හා ඊට අදාළ දෙපාර්තමේන්තු වල I ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීම අනුමත කිරීම සිදුකළ නොහැකි බවට සාධාරණ හේතුන් උපවය වී ඇති බව විද්‍යමාන වේ.

**17.** ඒ අනුව ජ්‍යෙෂ්ඨතාවයෙන් ඉහළ තනතුරු නොමැති නිලධාරීන් සිටියදී **2020.12.15** දින I ශ්‍රේණියට උසස් වීම් ලද නිලධාරීන් තනතුරු වලට පත්කිරීම, විධිමත් අධිකාරී බලයක් යටතේ සිදුකර නොමැති බව නිරීක්ෂණය කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම නිලධාරීන් තනතුරු වලට පත්කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරන ලදි. (ඇමුණුම IV)

**18.** අනතුරුව පහත නම් සඳහන් නිලධාරීන් පස්දෙනා විසින් නැවතත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරමින්, ඔවුන්ට මුදල් අමාත්‍යාංශය හා ඊට අදාළ දෙපාර්තමේන්තු වල I ශ්‍රේණියේ තනතුරු වලට පත් කරන ලෙස ඉල්ලීම් සිදුකර ඇත.

i. කේ.එස්.එම්.ද සිල්වා මයා
ii. කේ.පී.පී.යූ.කාරියවසම් මිය
iii. කේ.ඩී.අයි.එස්.කේ.සිරිවර්ධන මිය,
iv. ඩී.පී.එන්.කුමාරි මිය
v. ඩබ්.කේ.ඩී.ඩන්ස්ටන් මිය.

19. ඒ අනුව උක්ත නිලධාරීන් හට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා ලබාදී ඇති පත්වීම් විධිමත් අධිකාරී බලයක් නොමැතිව සිදුකර ඇති බැවින්, එම පත්වීම් බල රහිත බව නිරීක්ෂණය කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකී අභියාචනා නැවත වරක් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරන ලදි (ඇමුණුම V)

මෙම කරුණු වලට අමතරව අභියාචකවරුන් විසින් ඉදිරිපත් කරන ලද තවත් කරුණක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තම නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. ඒ අදාළ ලේඛනයේ 27 ඡේදයේ,

"27. තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභා 02/2022 චක්‍රලේඛය බලාත්මක වීම සම්බන්ධව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධව පහත සැළකිරීම් ඉදිරිපත් කර සිටිමි.

I. දීප ව්‍යාප්ත සේවාවල සහ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල විධායක සේවා ගණවල I ශ්‍රේණියේ තනතුරු වලට පත්කිරීමට නිලධාරීන් තෝරා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීමෙන් එම තනතුරු වලට වඩාත් සුදුසු නිලධාරීන් තෝරා ගැනීමට නොහැකි වුන බව මෙන්ම එම තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලත් නිලධාරීන්ට සාධාරණ අවස්ථාවක් නොලැබෙන බවට නිරීක්ෂණය කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දීප ව්‍යාප්ත සේවා, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විධායක සේවා ගණවල I ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීම සඳහන් නිලධාරීන් තෝරා ගැනීමට 02/2022 චක්‍රලේඛය 2022.09.15 දිනැතිව ප්‍රසිද්ධයට පත්කර ඇත. මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන 2023.01.01 දින සිට බලාත්මක විය.(ඇමුණුම් X)

II. 2022 නොවැම්බර් මස වන විට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතීම හා එවක පැවති රාජ්‍ය අමාත්‍යාංශ 2022.05.09 දිනැතිව අහෝසි වීම මත එම රාජ්‍ය අමාත්‍යාංශවල ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු වල සේවයේ නියුතුව සිටි නිලධාරීන්ගේ සේවා තත්ත්වය ගැටළු සහගත පසුබිමක සියලු නිලධාරීන්ට සාධාරණ අවස්ථාවන් ලබා දීම හා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත I ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීම වෙනුවෙන් අදාළ කොට ගෙන ඇත.

III. ඒ අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු වලට සාපේක්ෂව I ශ්‍රේණියේ නිලධාරීන් සංඛ්‍යාව ඉහළ බැවින් චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැර වීමේ හැකියාවක් නොමැති බව.

එසේම අභියාචකවරු දක්වා සිටින ෆොන්සේකා මහත්මියට පත්වීම ලබාදීම පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව කරුණු ඉදිරිපත් කර ඇත.

33. තවද අභියාචනයේ 05(1) ඡේදයේ සඳහන් පරිදි ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ පී.ඩබ්.එම්.යූ.ෆොන්සේකා මහත්මිය, එම සේවයේ I ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට පියවර ගන්නා ලද්දේ, එම නිලධාරිනිය 2020.04.21 දිනැතිව I ශ්‍රේණියට උසස් කර ඇති බැවින් සහ අභියාචක නිලධාරීන් හා සැසදීමේ දී ජ්‍යෙෂ්ඨතාවය ඉහළ නිලධාරිනියක් වන බැවින්, ඇය තනතුරක් සඳහා පත් කරනු ලැබීමට බාධාවක් නොමැති වීමය.

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි සුදුසු කාර්යක්‍ෂම හැකියාව පවතින නිලධාරීන් පත්කර ගැනීම සඳහා ද අවස්ථාව සළසා දී ඇති. මෙම නිරීක්‍ෂණ වල,

31. තවද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා සුදුසු තාක්‍ෂණික පසුබිමක් සහිත නිලධාරීන්, 04/2023 චක්‍රලේඛය යටතේ තෝරා ගැනීමට අවශ්‍ය අවස්ථාව ලබාදෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

32. ඒ අනුව මෙම අභියාචකයින් නිලධාරීන්ටද එකී සම්මුඛ පරීක්‍ෂණයට සහභාගී වී I ශ්‍රේණියේ තනතුරක සඳහා ඉල්ලුම් කිරීමේ ඉඩ ප්‍රස්ථාව හිමිව පවතින බව පැහැදිලි කරුණකි.

අවසන් වශයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දන්වා සිටින්නේ,

34. එමෙන්ම ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තනතුරු නොමැතිව සිටියදී I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවයෙන් පහළ මෙම නිලධාරීන් මුදල් අමාත්‍යාංශයේ I ශ්‍රේණියේ තනතුරු වලට පත්කිරීම සම්බන්ධව AAT/178/2023(PSC) නඩුව මගින් ද අභියෝගයට ලක්කර ඇති අතර, ඒ අනුව එකිනෙකට පරස්පර ඉල්ලීම් ද්විත්වයක් ඔබ විනිශ්චය අධිකාරයේ විභාග වීමට නියමිත බව ද අවධාරණය කර සිටිමි.

35. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම සියලු තත්ත්වයන් සාධාරණ ලෙස සළකා බැලීමෙන් අනතුරුව මෙම අභියාචකයන්ගේ අභියාචනා ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව විනිශ්චය අධිකාරය වෙත දන්වා සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව තම 2025.07.25 දින නිරීක්‍ෂන වශයෙන් තවදුරටත් දන්වා සිටින්නේ,

I. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පරිපාලන බලධාරියා වන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කර ඇති අංක PSC/APP/07/1253/**2018** සහ **2018.08.02** දිනැති ලිපියෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් වලට පටහැනි ආකාරයෙන් මෙම පත්කිරීම් සිදුකර ඇති බැවින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම පත්කිරීම් ප්‍රතික්ෂේප කර ඇති බව. (අංක PSC/APP/07/1253/**2018** සහ **2018.08.02** දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

II. මෙම ඉල්ලීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවස්ථා දෙකකදී, එනම් **2023.02.03** දිනැතිව සහ **2023.09.25** දිනැතිව ප්‍රතික්ෂේප කර ඇති අතර, එසේ ප්‍රතික්ෂේප කර තිබියදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිමත් අනුමැතියකින් තොරව මෙම නිලධාරීන් එම තනතුරු වල රාජකාරී කටයුතු වල නිරත වි ඇති බව,

III. මෙම නිලධාරීන් තනතුරු වලට පත්කිරීම සඳහා විධිමත් අධිකාරී බලය ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වන අතර, මෙම පත්කිරීම් මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ පොදු ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වැනි විධිමත් අධිකාරී බලයක් නොමැති නිලධාරීන් විසින් බව.

ඉහත සියළු කරුණු කෙරේ ගැඹුරින් සළකා බැලීමේ දී මෙම අධිකාරයට හැගී යන්නේ,

**01.** රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් /විනය බලධාරියා ලෙස ලබාදී ඇති උපදෙස් වලට පටහැනිව බලය නොමැති පුද්ගලයන් විසින් මෙම පත්වීම් සිදුකර ඇති බව.

**02.** මෙම පත්කිරීම් නිසා මෙයට පෙර මෙම සේවයේ I ශ්‍රේණියේ උසස්වීම් ලැබ ඒ වන විටත් තනතුරක් ලැබී නැති මෙම සේවයේ සේවකයන් පිරිසකට අගතියක් වන බව,

**03.** මෙම සේවයේම **2020**/දෙසැම්බර් මස I ශ්‍රේණියට උසස්වීම් ලැබූ මේ අයට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළ නිලධාරීන් සිටියදී ඒ අයට අඩුම වශයෙන් එම තනතුරට ඉල්ලීමක් හෝ කිරීමට අවස්ථාව අහිමි කරමින්, මෙම පත්කිරීම් සිදුකර ඇති බව. රාජ්‍ය පරිපාලන ලේකම් සකසා ඇති **2022.12.31** දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ මෙම අය සිටින්නේ, **172, 211, 212, 223, 224, 227,** වැනි ස්ථානවලය (ඇමුණුම VII)

4. මෙම පත්වීම් නිසා මෙම පිරිසට අමතර දීමනා/වෙනත් වරප්‍රසාද, ලබා ගැනීමට අවස්ථාව සැලසී ඇති බව. සමාන අවස්ථා අන් අයට අහිමි වී ඇති බව.
5. මේ අයුරින් එක් එක් ලේකම්වරයා පත්වීම් සිදුකළහොත්, දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් පත් කිරීමේ දී පරිපාලන බලධාරියා ලෙස කටයුතු කරන රාජ්‍ය පරිපාලන ලේකම්/අදාළ සේවාව භාර ලේකම් හා පත්වීම්/ විනය බලධාරියා ලෙස ක්‍රියාකරන රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන දෙදෙනාම අපහසුතාවයට පත්වන බව. නැතහොත් ඒ අයගේ බලය අභිබවා යමින් සමහර ලේකම්වරුන් කටයුතු කරනු ඇති බව. එය රාජ්‍ය සේවයට වැරදි පූර්වාදර්ශයක් සපයන බව.

ඉහත සඳහන් සියලු කරුණු කෙරේ අවධානය යොමු කළ මෙම අධිකාරය රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දී ඇති තීරණයන් තවදුරටත් තහවුරු කිරීමට තීරණය කරමු. ඒ අනුව මෙම අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු. මේ තීරණය අභියාචකවරුන්ට, ලේකම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-